# 10 ශ්‍රේණිය 14 පාඩම - ප්‍රතිශත

**$\frac{2}{5}$ ප්‍රතිශතයක් ලෙස දැක්වීම**

$$\frac{2}{5}=\frac{2\times 20}{5\times 20}=\frac{40}{100}=40\%$$

$$\frac{2}{5}\times 100=40\%$$

## ● බදු වර්ග හඳුනා ගැනීමට හා ඒ ආශ්‍රිත ගැටලු විසඳීම

- වරිපනම් බදු

පළාත් පාලන ආයතන තම බල ප්‍රදේශ තුළ සිදුකරන විවිධ පොදු කාර්යයන් වෙනුවෙන් වැය කිරීමට අවශ්‍ය මුදල් එම බල ප්‍රදේශ තුළ පිහිටා ඇති නිවාස, ඉඩකඩම් හා ව්‍යාපාරික ස්ථානවලින් අය කරයි. එම දේපළවල වාර්ෂික තක්සේරු වටිනාකමින් කිසියම් ප්‍රතිශතයක් වරිපනම් බදු ලෙස අය කෙරේ. මෙම බදු මුදල් සෑම වර්ෂයක් සඳහා ම ගණනය කෙරෙන අතර, එම මුදල් එකවර හෝ තුන්මසකට හෙවත් කාර්තුවකට වරක් බැගින් වූ සමාන වාරික 4කින් හෝ ගෙවිය හැකි ය

ගණිතය පෙළ පොතේ 144 පිටුවේ **14.1 අභ්‍යාසය 1,2,3,4,5 ගැටලු විසඳමු**

- තීරු බදු

සමහර භාණ්ඩ ආනයනයේ දී සහ අපනයනයේ දී එහි වටිනාකමින් කොටසක් රජයට බදු ලෙස ගෙවිය යුතු ය. එසේ අය කෙරෙන බදු මුදල් තීරු බදු ලෙස හැඳින්වේ. එය භාණ්ඩයේ මුල් වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස අය කරයි

| භාණ්ඩයක තීරු බදු ගෙවූ පසු වටිනාකම = මුල් වටිනාකම + තීරු බද්ද |
|---|

ගණිතය පෙළ පොතේ 144 පිටුවේ **14.1 අභ්‍යාසය 6,7,8,9,10 ගැටලු විසඳමු**

- ආදායම් බදු

යම් පුද්ගලයෙකු තම සේවා නියුක්තියෙන් හෝ තමා සතු දේපළවලින් හෝ පවත්වාගෙන යන ව්‍යාපාරවලින් හෝ ලබන වාර්ෂික ආදායම කිසියම් සීමාවක් ඉක්මවන විට ඒ සඳහා රජය බද්දක් අය කරයි. එවැනි බදු ආදායම් බදු ලෙස හැඳින්වේ.

ගණිතය පෙළ පොතේ 144 පිටුවේ **14.1 අභ්‍යාසය 11,12,13 ගැටලු විසඳමු**

- එකතු කළ අගය මත බදු

කිසියම් භාණ්ඩයක් මිල දී ගැනීමේ දී හෝ සේවාවක් ලබා ගැනීමේ දී එහි මුළු වටිනාකමින් කිසියම් ප්‍රතිශතයක් එකතු කළ අගය මත බදු ලෙස අය කෙරේ. භාණ්ඩ අලෙවිකරුවන් හා සේවා සපයන්නන් මෙම බදු මුදල් පාරිභෝගිකයන්ගෙන් අය කර ගන්නා අතර, එම මුදල් රජයට ගෙවීමට ඔවුහු බැඳී සිටිති.

ගණිතය පෙළ පොතේ 145 පිටුවේ **14.1 අභ්‍යාසය 14,15,16 ගැටලු විසඳමු**

## ● සුළු පොලිය ආශ්‍රිත ගැටලු විසඳීමටත්

කිසියම් ණය මුදලක් සඳහා කිසියම් කාලයකට පසු ගෙවීමට සිදු වන වැඩිපුර මුදල සුළු පොලිය ලෙස හැඳින්වේ. වෙනත් මූල්‍ය ආයතනයක තැන්පත් කළ මුදල සඳහා ද කිසියම් කාලයකට පසු ලැබෙන වැඩිපුර මුදල ද පොලිය ලෙස හැඳින්වේ. ණය මුදලෙහි ප්‍රතිශතයක් ලෙස පොලිය දැක්වූ විට එය පොළී අනුපාතිකය ලෙස හැඳින්වේ.

පොළී අනුපාතිකය $=\frac{\text{පොළිය}}{\text{ණය මුදල}}\times 100\%$

මුළු මුදල = ණය මුදල + පොළිය

$P=\frac{Irt}{100}$

P = පොළිය

I = ණය

r = පොළී ප්‍රතිශතය

t = කාලය

ගණිතය පෙළ පොතේ 148,149 පිටු වල **14.2 අභ්‍යාසයේ සියළු ගැටලු විසඳමු**